සියලු හිමිකම් ඇවිරිණි /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

※ **I** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, **II** කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, **III** කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ පහත සඳහන් ප්‍රවේශ කෙටියෙන් විස්තර කරන්න.
   (i) සමාජ විද්‍යාත්මක ප්‍රවේශය
   (ii) තුලනාත්මක ප්‍රවේශය (ලකුණු 10 × 2 = 20)

2. රාජ්‍යය සහ ආණ්ඩුව අතර ඇති වෙනස්කම් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 20)

3. පහත සඳහන් දේශපාලන මතවාදවලින් ඕනෑම **දෙකක** ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න.
   (i) ස්ත්‍රීවාදය
   (ii) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
   (iii) ෆැසිස්ට්වාදය (ලකුණු 10 × 2 = 20)

## II කොටස

4. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් ඕනෑම **දෙකක** බලතල සහ කාර්යයන් කෙටියෙන් සාකච්ඡා කරන්න.
   (i) ආණ්ඩුකාරවරයා
   (ii) රාජ්‍ය නිලධාරීන්
   (iii) රාජ්‍ය මන්ත්‍රණ සභාව
   (iv) අමාත්‍ය මණ්ඩලය (ලකුණු 10 × 2 = 20)

5. (i) 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සුළුතර කණ්ඩායම්වල ආරක්ෂාව සඳහා තිබුණු ව්‍යවස්ථාමය රැකවරණ **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05)
   (ii) 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සුළුතර කණ්ඩායම්වල ආරක්ෂාව සඳහා සපයා තිබුණු ව්‍යවස්ථාමය රැකවරණවල සාර්ථකත්වය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 15)

[දෙවැනි පිටුව බලන්න.

0013514

Disclaimer: The marked answers are incorrect. I will upload a clearer copy of the paper shortly.
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
Past Papers Wiki

Past Papers Wiki



6. ශ්‍රී ලංකාවේ 1972 ප්‍රථම සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 20)

7. (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ සංයුතිය, බලතල සහ කාර්යයන් විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර ඇති සම්බන්ධතාවය සාකච්ඡා කරන්න.

(ලකුණු 10 × 2 = 20)

## III කොටස

8. පහත සඳහන් ඕනෑම **දෙකක්** කෙටියෙන් සාකච්ඡා කරන්න.

(i) ප්‍රංශ ආණ්ඩුක්‍රමයේ ඒකීය ලක්ෂණ
(ii) ඉන්දියානු සන්ධීය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ
(iii) ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත ආණ්ඩුවල බලතල

(ලකුණු 10 × 2 = 20)

9. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමට බලපෑ ඕනෑම සාධක **හතරක්** විස්තර කරන්න. (ලකුණු 20)

10. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 19 වන සංශෝධනය
(ii) නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණ
(iii) ජාත්‍යන්තර දේශපාලනය තුළ රාජ්‍ය නොවන ක්‍රියාධරයින්
(iv) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය තුළ විපක්ෂයේ කාර්යභාරය
(v) ගැටුම් පිළිබඳ සරල වර්ගීකරණය

(ලකුණු 10 × 2 = 20)

* * *

PAST PAPERS WIKI

Disclaimer: The marked answers are incorrect. I will upload a clearer copy of the paper shortly

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library